**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අංක 09/2022 දරන 2022 දෙසැම්බර් 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයට අදාළ විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේද අවධාරණය කර ඇති පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේද වගකීම වුවද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. 31,975,880,000 ක් වුවත් ඒවායෙහි මුළු වියදම ඉක්මවා රු. 9,671,616,659 ක වටිනාකමකින්යුත් බැරකම් වලට සමාලෝචිත වර්ෂය තුළදී එළඹ තිබුණි. | ප්‍රතිපාදන ඇස්තමේන්තුව හැකිතාක් නිවැරදි ආකාරයෙන් පිළියෙල කර ඉදිරිපත් කොට ඇත. රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් නාවික හමුදාව විසින් ඇස්තමේන්තු කොට ඉල්ලුම් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය නාවික හමුදාව වෙත නොලැබුණි. නාවික හමුදා වෙත පැවරී ඇති රාජකාරී ස්භාවයන් මත මෙහෙයුම් හා පරිපාලන රාජකාරි අඛණ්ඩව හා ක්‍රමවත්ව පවත්වාගෙන යෑම ජාතික ආරක්ෂාවට ඉතාමත් අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් ඒ සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වියදම් දැරීම සිදුවීම මත ඇතැම් විෂයයන්ගේ අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් වලට එළඹීමට සිදුවී ඇත. එලෙස ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගැනීමට අත්‍යාවශ්‍ය වූ අවස්ථාවන්හිදී මුදල් රෙගුලාසි 94 (2) සහ 94 (3) මඟින් සලසා දී ඇති ප්‍රතිපාදන අනුව ක්‍රියා කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දැන්වේ. | බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි කටයුතු කළයුතු වීම. |
| (ii) | නාවික හමුදාවේ පුනරාවර්තන වැය විෂයයන් 05 කින් හා ප්‍රාග්ධන වැය විෂයයන් 13 කින් එකතුව රු. 5,294,900,000 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාළ එම වැය විෂයයන්හි බැරකම රු. 9,264,105,756 කින් වැඩි වී තිබුණි. | 2023 නොවැම්බර් මස 28 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නාවික හමුදාවේ ප්‍රතිපාදනවලින් රුපියල් බිලියන 5.29 ක් ප්‍රතිපාදන අනපේක්ෂිතව යුද්ධ හමුදාවට මාරු කිරීමට සිදුවිය. ඒ වන විටත් ඇණවුම්පත් ලබාදී දෙස් විදෙස් සැපයුම්කරුවන් හා ගිවිසුම් වලට එළඹව තිබූ විෂයයන් නාවික හමුදාව වෙත එම වර්ෂයේ සැපයීම හේතුවෙන් ඊට අදාල බිල්පත් නිරවුල් කිරීමට එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන සීමාව ප්‍රමාණවත් නොවීම බැරකම් වැඩී | බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි කටයුතු කළයුතු වීම. |

වීමට හා වියදම් කළමනාකරණය කර ගැනීමට නොහැකි වීමට හේතුවක් විය.

**(ආ) මූලධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වත්කම් අත්පත් කර ගැනීමට තිබූ රු. 152,890,000 ක් හා යටිතල පහසුකම් සංවර්ධනයට තිබූ රු.190,027,000 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකිරීම හේතුවෙන් නාවික හමුදාවේ ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය අඩාලවීමෙන් ඉදිරි මෙහෙයුම් කාර්යන් හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දුර්වලවීමට හේතුවිය හැකිබව නිරීක්ෂණය කරනු ලැබේ. | ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන යුද්ධ හමුදාවේ ආහාර පාන හා නිල ඇඳුම් වියදම් සඳහා මාරු කිරීම හේතුවෙන් නාවික හමුදාවේ ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය අඩාල වීමට හේතුවක් විය හැකි බවට දක්වා ඇති කරුණ සම්බන්ධයෙන් එකඟවන නමුත්, 2023 නොවැම්බර් මස 28 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින වියදම් ඒකක මගින් අපේක්ෂිත ඉතිරිවීම් අවුරා තබන ලදී. ඒ යටතේ නාවික හමුදාව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන මඟින් රුපියල් බිලියන 5.29 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අවුරා තැබීමට කටයුතු කරන ලදී. | මූලධන වත්කම් සංවර්ධනය සඳහා ඉදිරියේදී වැඩි අවධානයක් යොමුකළ යුතු වීම. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරන සාරාංශය අනුව නාවික පුද්ගලයින් 266 දෙනෙකුගෙන් 2001 වර්ෂයේ සිට අයවිය යුතු රු. 15,671,072 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී නොතිබුණි. අයකර ගැනීම් පිළිබඳව ප්‍රමාණවත් ලිපිගොණු පවතින බවට තහවුරු කර ගෙන තිබූ රු. 25,000 ට වැඩි ශේෂයන් පවතින නාවික පුද්ගලයින් 230 කගෙන් අයවිය යුතු රු. 13,754,080 ක් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. ඉතිරි නාවික පුද්ගලයින් 36 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,916,992 ක් සම්බන්ධයෙන් අයකර ගැනීම් පිළිබඳව තොරතුරු අදාල ප්‍රාදේශීය | ශ්‍රී ලංකා නාවික හමුදාවේ අත්තිකාරම් බී ගිණුමේ 2001 වර්ෂයේ සිට අයවිය යුතු රු.15,671,072ක ණය ශේෂයෙන් රු.25,000ට වැඩි ශේෂයන් පවතින පුද්ගලයන් 230කගෙන් අයවිය යුතු රු.13,754,080ක ශේෂයක් කපාහැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉතිරි රු.1,916,992.00ක ශේෂය අයකර ගැනීම සඳහා තවදුරටත් ලිපිගොනු සොයා තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කරගනිමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ හිටි අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාල සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ii) | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු. 523,138,367 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය රු. 501,512,741 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු. 21,625,626 ක වෙනසක් පැවතුණි. 2001 වර්ෂයේ සිට පැවත එන මෙම වෙනස සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත් කර තිබුණු කමිටුවේ වාර්තාව අනුව මෙම වෙනස පරීක්ෂා කිරීමට පොත්පත් සහ ගිණුම් සාරාංශ නාවික හමුදාව සතුව නොමැති බැවින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා නාවික නීති අංශය මැදිහත් වීමෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හා අත්තිකාරම් පාලන ගිණුමේ වෙනස එලෙසම පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඒම ශේෂයන් අතර පැවති රු.21,625,626 ක වෙනස සහ රු.18,251,726.34 ක දීර්ඝ කාලයක් අය නොවන වෙනත් ණය ලෙස දැක්වෙන ශේෂය සම්බන්ධයෙන් පත්කළ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි ඉහත විෂමතාවයන් කපා හැරීමට තීරණය කරනු ලැබූ බැවින් පළමුව රු. 18,251,726.34 ක අය නොවී පවතින ශේෂයෙන් රු.16,848,699.61 කට අදාල කපාහැරීම් සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර එයින් රු.2,509,087.87 ක ණය ශේෂයක් අරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත කපාහැරීම් සිදුකර ඇත. | වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකළ යුතු වීම. |
| (iii) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව අවුරුදු එකත් දහයත් අතර කාලයක සිට සේවය හැරගිය සේවකයින් 36 කගෙන් රු. 4,121,081 ක් ද, විශ්‍රාම ගිය සේවකයින් 07ක ගෙන් රු. 896,373 ක් ද, වැඩ තහනම්කල සේවකයකුගෙන් රු. 234,994 ක් ද, මියගිය සේවකයින් හතර දෙනෙකුගෙන් රු. 531,409 ක් ද වශයෙන් සේවකයින් 48 කගෙන් රු. 5,783,857 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව අවුරුද්දක් ඉක්මවා ඇති අයකරගත යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් මේවන විටත් ගෙන ඇති හා ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ගයන් ලෙස ඇපකරුගෙන් අයකර ගැනීම , නීති අංශය වෙත යොමු කිරීම, කොටස් වශයෙන් අයකර ගැනීමට එකඟකරවා ගැනීම වැනි කටයුතු සිදුකර ඇත. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාවික හමුදාව සතු සුනඛයින් 28 දෙනකුගේ රු. 2,537,000 ක් වූ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සුනඛයින් මිලදී ගැනීම සඳහා වැය විෂයය 2103 වෙතින් දරන ලද වියදම පසුව මාර්ගස්ථ සිගාස් තද්ධතිය මඟින් නිවැරදි වැය විෂයට මාරු කර ඇති බව කාරුණිකව දැන්වේ. තවද, පොලීසිය වෙත සතුන් මිලදී ගැනීම සඳහා වැය විෂයය 2509-13 යටයතේ ප්‍රතිපාදන වෙන් කර ඇති බව නිරීක්‍ෂණය වේ. මින් ඉදිරියට නාවික හමුදාව වෙතද සුනඛයින් මිලදී ගැනීම වෙනුවෙන් අවශ්‍යය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදීම නිවැරදි වැය විෂයකට වෙන් කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැන්වේ. | නිවැරදි වැය විෂයය යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| | (i) 3 හා 6 වගන්ති | ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම්, ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් සහ ගිණුම් පරීක්ෂා කළ යුතු වුවද, නාවික හමුදාවේ මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, කෘෂි ව්‍යාපෘති, තල් මසුන් නැරඹීමේ ව්‍යාපෘති, නිවාඩු නිකේතන ආදියේ අරමුදල්වලට අදාල ආදායම් වියදම් සම්බන්ධ ගිණුම් වාර්තා හා ලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සුභසාධක ව්‍යාපෘතීන් රාජ්‍ය නොවන අරමුදල් මගින් ආරම්භක ප්‍රාග්ධනය සපයා ගෙන සංස්ථාපනය කොට නාවික හමුදා සේවයේ නියුතු නාවික පුද්ගලයින්, විශ්‍රාමික නාවික පුද්ගලයින්, යුද්ධයේදී මියගිය ආබාදිත සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ සහ ඔවුන්ගේ ලඟම ඥාතීන්ගේ සුභසාධනය අරමුණු කරගෙන පවත්වාගෙන යනු ලබන අතර, පූර්ණ වශයෙන් ලාභ ඉපයීම පරමාර්ථය නොවූ සුභසාධන ව්‍යාපෘතීන් වේ.<br><br>ත්‍රිවිධ හමුදාව, ආරක්‍ෂක අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කර | සියළු අරමුදල් ව්‍යාපෘති වලට අදාළ ආදායම්, වියදම් හා ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇති අතර, එහි අවසන් නිගමනයන්ට මේ දක්වා එළඹී නොමැති බැවින් ඉදිරියේදී ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | |
| (ii) | 6(3) වගන්තිය | මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ විගණකාධිපතිවරයා විමසා අස්ථිත්‍යවල ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම්ලත් විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවද, නාවික හමුදාවේ අරමුදල් විගණනය සඳහා පත්කර තිබූ විගණකවරයා එකී විධිවිධාන ප්‍රකාරව පත්කර නොතිබුණි. | 2016 වර්ෂයේ පවත්වන ලද රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝග අංක 09 ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් නාවික හමුදාව තුළ පවත්නා රාජ්‍ය නොවන වත්කම් විගණනය කිරීම සඳහා පිළිගත් විගණන ආයතනයක් වෙත මේ වන විට ගිණුම් ලබා දෙමින් පවතින අතර ඉදිරි මූල්‍ය වර්ෂ සඳහා විගණකවරුන් පත් කිරීමේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(3) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත දැනුම් දීමට කටයුතු කරන බව කාරුණිකව දැන්වේ. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 101 වගන්තිය | 2010 ජූලි මස 21 වන දින සිට 2011 අගෝස්තු මස 21 වන දින දක්වා කාලය තුළ ශ්‍රීලංනානෞ "පැරකුම්බා" ආයතනයේ ආහාර ගබඩාව වෙත සැපයුම්කරුවන් විසින් ආහාර සැපයීමේදී සහ ආහාර ගබඩාව වෙතින් මුළුතැන්ගෙයට ආහාර නිකුත් කිරීමේදී සිදු වී තිබූ රු.7,721,406 ක අලාභය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වරදකරුවන් 11 දෙනෙකු 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ඉන් 04 දෙනෙකුට අදාල අලාභය නාවිකයින්ගේ සුභපැතීමේ ත්‍යාග අරමුදලින් අයකර තිබුණද, ඉතිරි නාවිකයින් 07 දෙනාට අදාල අලාභය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මෙම අලාභයට සම්බන්ධව නාවික පුද්ගලයින් දෙදෙනකු නාවික සේවයෙහි රැඳී සිටින අතර තවත් එක් අයකුගේ සේවය අත්හිටුවා ඇත. තවද මෙම සිදුවීමට අදාල සෙසු නාවික පුද්ගලයින් තිදෙනකු වසර 22 සම්පූර්ණ වීමට ප්‍රථම නාවික හමුදාවෙන් ඉවත්වී ඇති අතර එක් පුද්ගලයකු වසර 22 සේවා කාලය අවසන් වීමෙන් පසු විශ්‍රාම ගොස් ඇත. තවද මොවුන්ගේ සේවා පාරිතෝෂිකය මඟින්ද අයකරගැනීම් කර නොමැති බව පෙනී යයි. විශ්‍රාම වැටුපකට හිමිකම් තිබෙන පුද්ගලයාගේ විශ්‍රාම වැටුප අත්හිටුවීමට හෝ කටයුතු කර නොමැත.<br><br>මෙම පුද්ගලයන්ගෙන් අයකරගැනීම් සම්බන්ධව සිවිල් අධිකරණයේ නඩු පැවරීමට නාවික හමුදා නීති අංශය මඟින් පියවර ගනිමින් සිටින අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මූතූර් අධිකරණයේ නඩුවක් | මෙම අලාභය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගොනුකර ඒ සම්බන්ධවද කටයුතු කරමින් සිටී. | |
| (ii) | මු.රෙ. 104 වගන්තිය | පාඩුවක් හෝ අලාභ හානියක් ඇති වූ වහාම පරීක්ෂණයක් කළ යුතු වුවත්, විදේශීය මිලදී ගැනීම් අංශයේ මිලදී ගැනීම්වලින් අගය එකතු කිරීමේ බදුවලින් (VAT) නිදහස් කර තිබූ භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත අගය එකතු කිරීමේ බදු ලෙස රු.2,329,345 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 නොවැම්බර් මස 23 දින නාවික හමුදා පරීක්‍ෂණ මණ්ඩලයක් පත් කරන ලදී. එම වාර්තාවේ අලාභය සම්බන්ධ ඉදිරිපත්කර ඇති නිර්දේශ අනුව වගකිව යුතු පුද්ගලයින් කවුරුන්දැයි නම් කර නොමැති බැවින් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සැලකිල්ලට ගෙන පරීක්ෂණ මණ්ඩල වාර්තාව නැවත සකස් කලයුතු බව පෙනී යන බැවින් පරීක්‍ෂණ මණ්ඩල වාර්තාව නැවත සකස් කිරීම සඳහා පරීක්‍ෂණ මණ්ඩලය වෙතට නැවත යොමු කොට ඇත. | පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාකළ යුතු වීම. |
| (iii) | මු.රෙ. 177(1) වගන්තිය | රැස්කරන රජයේ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවද, නාවික නිලධාරීන්ගේ හා නාවිකයන්ගේ සුභ සාධක කටයුතු සඳහා යොදවා තිබෙන සුඛෝපභෝගී බස් රථ 04 කින් හා වෑන් රථ 02කින් නාවික හමුදාව 2022 හා 2023 වර්ෂයන් වලදී උපයා තිබූ රු. 19,880,407 ක ආදායම නාවික හමුදාවේ සුභ සාධක අරමුදලට බැරකර තිබුණි. එම කාලපරිච්ඡේදයට අදාලව ඉන්ධන සඳහා රු. 17,113,256 ක් ද අළුත්වැඩියා වියදම් සඳහා රු. 4,486,420 ක් ද වශයෙන් රු. 21,599,676 ක වියදමක් එම වාහන වෙනුවෙන් නාවික හමුදාව විසින් දරා තිබුණි. | සේවයේ නියුතු, විශ්‍රාමික, යුද්ධයේදී මියගිය හා අබාධිත නාවික පුද්ගලයන් සහ ඔවුන්ගේ ලඟම ඥාතීන්ගේ සුභසාධනය උදෙසා සහනදායී මිල ගනන් යටතේ සුභසාධන කටයුත්තක් ලෙස නාවික හමුදාධිපතිගේ සංදේශයක් මගින් නිසි ක්‍රමවේදයක් අනුව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම බස්රථ සහ වෑන්රථ ලබාදීම සිදුකරයි. එයින් අයකරගනු ලබන මුදල් එම රථවල ධාවනයේදී සිදුවන අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා යොදවනු ලැබේ. ත්‍රිවිධ හමුදාව, ආරක්‍ෂක අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එහි අවසන් නිගමනයන්ට මේ දක්වා එළඹී නොමැති බැවින් ඉදිරියේදී ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | ඒකාබද්ධ අරමුදලට හිමි ආදායම් රැස්කිරීමට නොපමාව කටයුතු කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.6 (අ) වගන්තිය | ශ්‍රී ලංකාව තුළ ඇති ශ්‍රමය, අමුද්‍රව්‍ය සහ සංරචක පිරිනමනු ලබන නිෂ්පාදනයේ (Ex work) මිලෙන් සියයට 30 වන විට හා අඩුම තරමින් ලංසු ඉදිරිපත් කළ අවස්ථාවේ සිට එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ / එකලස් කිරීමේ කටයුතුවල නිරත වන විට දේශීය ප්‍රමුඛතාවය මත සියයට 20 ක ආන්තිකයක් ලබාදිය යුතු වුවද, ඊට පටහැනිව කටයුතු කිරීම මත ආරක්ෂිත පාවහන් යුගල් 3000 ක් මිලදී ගැනීමේදී රු. 2,236,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම ඇගයීමට ලක් කල පාවහන් අතරින් මෙම පාවහන් බරෙන් වැඩි බවද ගුණාත්මක භාවය අසතුටුදායක වී තිබූ බවද නිරීක්ෂණය විය. | අදාල සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සාමාජිකයකු පත් කර ගැනීමට ගණකාධිකාරි (ආදායම් හා වත්කම් කළමනාකරණ) වෙත 2024 මැයි මස 01 වන දින නාවික හමුදාධිපතිගේ ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අදාල පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත බව වැඩිදුරටත් දැන්වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර කටයුතු කළයුතු වීම හා බැහැරවීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු වීම. |
| (ඈ) | අංක 07/2017 දරන 2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය | රජයට සම්බන්ධ ආයතනයකින් යතුරුපැදි 03 ක් ද, අත්අඩංගුවට ගත් වාහන 50 ක් ද වශයෙන් වූ ලියාපදිංචි අයිතියක් නොමැති වාහන හා යතුරු පැදි 53 ක් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයට කරුණු වාර්තා කර තිබුණ ද, ඒ පිළිබඳ වූ ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි. එම වාහනවලින් බොහොමයක් වාහන භාවිතයට ගත නොහැකි මට්ටමක පැවති බවද නිරීක්ෂණය විය. | මෙම රථ වාහන නාවික හමුදාවට අත්පත් කරගෙන වසර 14ක පමණ කාලයක් ගතවී ඇති අතර, බොහෝමයක් රථ වාහන අලුත්වැඩියා කිරීමට සිදුව ඇත. එම අලුත්වැඩියාවන් සිදු කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවන බැවින් යුධ සමයේ අත්පත් කර ගත් ඉතිරි වාහන 50ද පෙර පරිදි අබලි ද්‍රව්‍ය ලෙස සුදුස්සක් කිරීමට කටයුතු කරන බව යෝජනා කරන ලදි. ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මඟින් මේ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | හිමිකම් නොමැති හා භාවිතයට ගත නොහැකි වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නෞකා, බෝට්ටු, යාත්‍රා 271 කින් අක්වෙරළ නිරීක්ෂණ නෞකා 06 ක්, වේග ප්‍රහාරක නෞකා 03 ක්, වෙරළ ආරක්ෂක වේග ප්‍රහාරක යාත්‍රා 31 ක්, වේග ප්‍රහාරක මුර යාත්‍රා 11 ක්, වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා 08 ක් මඟී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා 04 ක් වශයෙන් වූ නෞකා හා යාත්‍රා 63 ක් | මෙම යාත්‍රා අතරින් කොටසක් අළුත්වැඩියා කරමින් පවතින අතර තවත් යාත්‍රා කොටසක් සඳහා අමතර කොටස් ඇණවුම්කර ඇති නමුත් අමතර කොටස් ලැබී නොමැත. | ප්‍රතිපාදන අපේක්ෂිත කාර්යයන් සඳහා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කළයුතු වීම . |

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අක්‍රියව පැවතුණි. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා නෞකා, බෝට්ටු, යාත්‍රා, අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 38,146,514,747 ක් ඇස්තමේන්තුගත කර තිබුණ ද, ප්‍රතිපාදන රු.17,850,651,000 ක් පමණක් ලැබී තිබීමත්, ලද ප්‍රතිපාදනවලින් රු.12,736,971,040 ක් පමණක් යොදවා තිබීමත් මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාවික හමුදාවේ Material digital camaflag , Material olive green, Black drill සහ Material cloth truser inner යන රෙදි වර්ග වල රෙදි මීටර් 57,014 ක් 2019 වර්ෂය අවසාන වන විට ගබඩාවේ තිබියදී සහ වාර්ෂික තොග අවශ්‍යතාවය පිළිබඳව ඇගයීමකින් තොරව 2020 සහ 2021 වර්ෂවලදී රෙදි මීටර් 164,520 ක් මිළදී ගෙන තිබුණි. 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ අවුරුදු 04 ක කාලය තුල එම රෙදි වර්ග වලින් රෙදි මීටර් 96,175 ක් පමණක් නිකුත්කර තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේ සිට පැවත එන තොග වලින්ද සමන්විත වූ රෙදි මීටර් 125,359 ක පමණ තොගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගබඩාවේ පැවතුණ අතර එම රෙදි වල ගුණාත්මක භාවය අඩු වී තිබුණු බවද නිරීක්ෂණය විය. | 2024 වර්ෂය සඳහා නාවික පුද්ගලයින් 4,169 පමණ බඳවා ගැනීමට සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ නාවික පුද්ගල මගින් ඉදිරිපත් කර ඇතත්, 383 ක් පමණක් බඳවා ගෙන ඇති අතර, මෙම වර්ෂය තුල ඉතිරි ප්‍රමාණය බඳවා නොගතහොත් ඇණවුම් කර ඇති නිල ඇඳුම් ප්‍රමාණය නිකුත් නොවී පැවතිය හැක. | රජයේ මුදල් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණක් පිරිමැසුම්දායක ලෙස උපයෝජනය කළයුතු බව. |
| (ආ) | Material Woollen Polyester dark blue 6 (A), Material woolen polyester reefer suit සහ Material wooden mess Jacket රෙදි මීටර් 18,145 ක් රු. 24,949,100 ක වටිනාකමකට 2012 වර්ෂයේදී මිලදීගෙන තිබූ අතර 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල එම අයිතමයන්ගෙන් රෙදි මීටර් 12,378 ක් පමණක් නිකුත් වී තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රෙදි මීටර් 5,767 ක් ගබඩාවේ පැවතුණි. විශාල තොග ප්‍රමාණයක් මිළදී | රෙදි ගබඩාව තුල මේ වන විට Material Woolen Polyester Dark Blue 6(A) රෙදි මීටර 2,997.30, Material Woolen Polyester Reefer Suit රෙදි මීටර් 1,750.85 හා Material Woolen Mess Jacket රෙදි මීටර 1,019.00 ක ප්‍රමාණයක් තොගයේ පවතී. මෙම රෙදි 2012 වසරේදී මිලදී ගැනීම සිදුකර ඇති අතර, 2014 දෙසැම්බර් 10 දිනැති අංක WAS/01/2014 දරණ අධ්‍යයන | රජයේ මුදල් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණක් පිරිමැසුම්දායක ලෙස උපායෝජනය කළයුතු බව හා පවත්නා රෙදි තොගය ඵලදායී කටයුතු සඳහා භාවිතා කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමෙන් පසු 2014 වර්ෂයේ සිට එම රෙදි වලින් නිල ඇඳුම් මැසීම නතර කිරීමට තීරණය කිරීම හේතුවෙන් අවුරුදු 11 කට වැඩි කාලයක සිට එම රෙදි තොග ගබඩාවේ ගොඩගැසී ඇති අතර ඒවායේ ගුණාත්මකභාවය ද හීන වී ගොස් තිබුණි. | වාර්තාව මගින් නිර්දේශ කර ඇති පරිදි, මෙම නිල ඇඳුම් වර්ග 03 අළුතෙන් මැසීම නතර කර ඇත. මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිර්දේශ ලබාගැනීමට නාවික හමුදා අභ්‍යන්තර අධ්‍යයන මණ්ඩලයක් පත්කිරීමටද කටයුතු කර ඇත. | |
| (ඇ) | මධ්‍යම නිළ ඇඳුම් ගබඩාවට නව කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමෙන් පසු 2023 ඔක්තෝබර් 31 දින කර තිබූ ගබඩා තොග සමීක්ෂණ වාර්තාව අනුව තොග අයිතම් 269 ක තොග ඒකක 9401 ක අතිරික්තයක්ද, තොග අයිතම් 227 ක තොග ඒකක 8635 ක ඌණතාවයක්ද තිබූ අතර ඒ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මධ්‍යම නිල ඇඳුම් ගබඩාවේ තොග අයිතමයන්හී අතිරික්තයක් හා ඌණතා පැවතීම සම්බන්ධව විධිමත් පරීක්‍ෂණයක් දැනටමත් සිදු කරමින් පවතී. | කඩිනමින් පරීක්ෂණ කටයුතු අවසන් කර සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| (ඈ) | බාහිර පාර්ශවයන්ට සැපයු සේවා වෙනුවෙන් ඉපයු ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඉතිරි වී තිබූ රු. මිලියන 337.5 කින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට එකග වී තිබූ සියයට 40ක ප්‍රමාණය වන රු. මිලියන 135 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | 2016 වර්ෂයේදී නාවික හමුදාවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් පුහුණු ඒකකය යටතේ විදේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී වූ නාවික පුද්ගලයින්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි රු. මිලියන 147.4 ක මුදලක් ලබා දී ඇති අතර, එම මුදල් මේ දක්වා ප්‍රතිපූර්ණය වී නොමැති අතර, එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළයුතු වීම. |
| (ඉ) | නාවික හමුදාවේ නැවිරු සවිය සුවසහන අරමුදල ආයතන නීතිවලට අනුගත වන්නේද යන්න පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා නාවික හමුදාව තුල විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට යටත්ව (ශ්‍රීලංනාහ නියෝග 0826 සහ නැවිරු සවිය ව්‍යවස්ථාව අනුව) දැනට සේවයේ නියුතු නාවික පුද්ගලයින් සහ නීත්‍යානුකූලව නාවික හමුදාවෙන් විශ්‍රාම ගොස් සිටින නාවික පුද්ගලයින් හා | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය ඉහල නැංවීම අරමුණ කර ගනිමින් දැනට නාවික හමුදාව තුල නාවික පුද්ගලයින්ට ලබාදෙනු ලබන වෛද්‍ය පහසුකම්වලට අමතරව සෞඛ්‍යමය මුලාධාර ලබාදීම අරමුණු කරගෙන “නැවිරු සවිය නාවික සුවසහන අරමුදල” නමින් මෙම සුභසාධක අරමුදල ආරම්භ කර ඇත. | |
| (ඊ) | නාවික හමුදාව මඟින් පවත්වාගෙන යනු ලබන සියළුම ආදායම් උපයන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට පවතින මූල්‍ය රෙගුලාසිවලට අනුව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන එහි වාර්තාවක් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යොමුකර නොතිබුණි. | නාවික හමුදා මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘති, කෘෂි ව්‍යාපෘතිය, නිවාඩු නිකේතන ආදී ආදායම් උපයන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් 2024 මැයි මස 14 වන දින මුදල් අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේ තීරණ අනුව ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙන උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව දැන්වේ. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළයුතු වීම. |
| (උ) | නාවික හමුදාව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර එම ව්‍යාපාරවලට යොදවා ඇති ආරම්භක ප්‍රාග්ධන ප්‍රමාණය, ආදායම්, වියදම්, ලාභ හෝ අලාභ සම්බන්ධ වාර්තාවක් රජයේ ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | සුභසාධක ව්‍යාපෘතින් රාජ්‍ය නොවන අරමුදල් මගින් ආරම්භක ප්‍රාග්ධනය සපයා ගෙන සංස්ථාපනය කොට නාවික හමුදා සේවයේ නියුතු නාවික පුද්ගලයින්, විශ්‍රාමික නාවික පුද්ගලයින්, යුද්ධයේදී මියගිය ආබාදිත සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ සුභසාධනය අරමුණු කරගෙන පවත්වාගෙන යනු ලබන අතර, පූර්ණ වශයෙන් ලාභ ඉපයීම පරමාර්ථ නොකර ගනිමින් පවත්වාගෙන යනු ලබන සුභසාධන ව්‍යාපෘතීන් වේ. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ඖෂධ තොග උපයෝජනය කිරීමේ රටාව පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව 2023 වර්ෂයේදී පිරිවැය රු.4,073,197 ක්වූ ඖෂධ සහ ශල්‍ය උපකරණ තොග අවස්ථා 123 කදී සුළු මුදල් අග්‍රිමය මගින් මිලදී ගැනීම සඳහා කටයුතු කර තිබුණු අතර මෙම අයිතම ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමනාකරණ පද්ධතියට (ILMS) ඇතුළත් කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි. | සුළු මුදල් අග්‍රිමය මගින් ලබා ගන්නා ඖෂධ ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමණාකරණ පද්ධතිය වෙත ඇතුලත් කර ඉදිරි කටයුතු කිරිම සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා ගැනීමට නිසි අනුමැතිය අධ්‍යක්ෂ ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමණාකරණ පද්ධතිය මගින් ලැබුණු පසු සුළු මුදල් අග්‍රිමය මගින් ලබා ගන්නා ඖෂධ ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමණාකරණ පද්ධතිය හරහා සිදු කිරිමට කටයුතු කරන බව දැන්වේ . | ඖෂධ ප්‍රසම්පාදන කටයුතු වලදී අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන සිදුකළයුතු වීම හා සුළු මුදල් අග්‍රිමයෙන් මිලදී ගැනීම් ද **ILMS** පද්ධතියට ඇතුළත් කළයුතු වීම. |
| (එ) | රජයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් මිළදී ගත් පිරිවැය රු.1,860,619 ක්වූ ඖෂධ වර්ග 49 ක් විවිධ හේතුන්මත තවදුරටත් භාවිතා කිරීම නවතන ලෙස වෛද්‍ය සැපයුම් අංශය මගින් ලබාදුන් උපදෙස් හේතුවෙන් මධ්‍යම ඖෂධ ගබඩාව තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි. | එලෙස උපදෙස් ලබා දුන් එම ඖෂධයන්ගෙන් ඇතැම් ඖෂධ දැනට කල් ඉකුත් වී ඇත.<br><br>එම අයිතමයන් වෙනුවට නව ඖෂධ ලබා ගැනීම හෝ එහි වටිනාකම වෙනුවෙන් වෙනත් ඖෂධ ලබා දෙන ලෙසට විටින් විට ලිපි මගින් වෛද්‍ය සැපයුම් අංශය දැනුවත් කිරීම් සිදු කලද නිශ්චිත පිළිතුරක් මේ වන තෙක් ලැබී නොමැත. වෛද්‍ය සැපයුම් අංශය මගින් ලබා දෙන පිළිතුරු ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දැන්වේ. | පිරිවැය අයකර ගැනීමට හෝ එම ඖෂධ සඳහා විකල්ප ඖෂධ ලබා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් ඇතිකරගත යුතු වීම. |
| (ඒ) | ඖෂධ අයිතමයන්හි ශේෂය සෘණ අගයක් පෙන්වීම, සෙමින් නිකුත් වන ඖෂධ අයිතමයන් රජයේ රෝහල් අතර හුවමාරු කර ගැනීමට පහසුකම් නොමැති වීම, වැලිසර රෝහල් පද්ධතියේ Sever යන්ත්‍රයේ සබඳතාවය විටින් විට බිඳ වැටීම වැනි දුර්වලතාවයන් ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමණාකරන පද්ධතියේ පැවතුණි. | ඖෂධ අයිතමයන් රජයේ රෝහල් අතර හෝ වෙනත් බාහිර පාර්ෂවයක් අතර හුවමාරු කර ගැනීම පිළිබඳව ඒ.සැ.සේ.ක. පද්ධතියේ පහසුකම් සලසා පද්ධතිය යාවත්කාලීන කර දෙන ලෙස මේ වන තෙක් ඉල්ලීමක් සිදු කර නොමැති අතර Server තුල ඇති වූ බිඳ වැටීම් පිළිබඳ කිසිදු දැනුවත් කිරීමක් නාවික මහරෝහල වැලිසර වෙතින් මේ වන තෙක් සිදු කර නොමැත. දීර්ඝ කාලීන වශයෙන් අදාල විෂයන් නිකුත් කිරීම හා තොග ගත කිරීම් පද්ධතිය තුලින් නිවැරදි ලෙස | අදාල අංශය විසින් මෙම ගැටළු වලට නිසි ක්‍රියාමාර්ග ගතයුතු බව. |

| | | |
|---|---|---|
| | සිදු කර නොමැති බවට නිරීක්ෂණය වන අතර, සෘණ අගයක් පද්ධතිය තුල පෙන්වීමට එය හේතු වී ඇත. දැනට පවතින භෞතික තොග තත්වය සහ පද්ධතියේ හි පවතින තොග තත්වය යාවත්කාලීන කර ගැනීමට කටයුතු කල හැකි බව දැන්වේ. | |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ අවුරුදු 05 ක කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් සහ නාවිකයින් පිළිවෙලින් 537 දෙනෙකු හා 9,011 දෙනෙකු බඳවාගන්නා විට විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සංඛ්‍යාව පිළිවෙලින් නිලධාරීන් 580 ක් සහ නාවිකයින් 17,734 ක් වී තිබුණි. ඒ අනුව නාවික හමුදාවෙන් ඉවත්ව යන සංඛ්‍යාවට සාපේක්ෂව බඳවා ගන්නා සංඛ්‍යාව සියයට 52 ක අඩු මට්ටමක පැවතුණි. | විශාල ප්‍රමාණයක් කෙටි කාලසීමාවක් තුල සේවයෙන් විශ්‍රාම ගැනීම ඉදිරි සේවා කාලය සඳහා නැවත සේවය ලබාගැනීමට අකැමැත්ත ප්‍රකාශ කර සිටීම, අනුමත සේවා කාලයට ප්‍රථම වෙනත් රැකියාවක නිරතවීමට/ විදේශ ගතවීම වැනි කටයුතු සඳහා සේවයෙන් නිත්‍යානුකූලව ඉවත්වීම හෝ සේවය අතහැරයාම, 2019 සිට 2022 වසර දක්වා රටේ පැවැති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නව බඳවා ගැනීම් පහත වැටීම, 2022 වර්ෂයේ රජය විසින් රාජ්‍ය ආයතන වෙත නව බඳවා ගැනීම් අත්හිටුවීමට කටයුතු කිරීම වැනි හේතු බලපා තිබුණි.<br><br>බඳවා ගැනීම් ප්‍රවර්ධන කිරීම සඳහා නාවික හමුදා වෙබ් අඩවිය ඔස්සේ මෙන්ම සමාජ ජාලා ඔස්සේ පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පාසල් මගින් නාවික හමුදා සේවයේ ඇති වැදගත් කම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | සේවය හැර යාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම හා බඳවාගැනීම් කඩිනම් කිරීමට කටයුතු කළයුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශාරීරික අභ්‍යාස, නීති,තොරතුරු තාක්ෂණ, වාදක, ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු, නිත්‍ය නාවික, විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් නාවික යන අංශයන්හී 2012 වර්ෂයේ සිට 2024 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුල ඇති වී තිබූ ඉංජිනේරු වෘත්තියේ නිලධාරීන් 68 ක්, ඉදිකිරීම් හා කාර්මික ක්ෂේත්‍රයට අදාල නාවිකයින් 3,896 ඇතුළුව විශේෂ කුසලතාවයන්ගෙන් යුත් නිලධාරීන් 90 කගේ සහ නාවිකයින් 4,103 කගේ පුරප්පාඩු දීර්ඝ කාලයක සිට පැවතුණි. | වාර්ෂිකව නාවික හමුදාවේ අනෙකුත් ආරක්ෂක හා පරිපාලන කටයුතු සඳහා ඉතා සීමිත නාවික පුද්ගලයින් ප්‍රමාණයක් බඳවා ගැනීමට රජය විසින් අනුමැතිය ලබාදී තිබීම එක්වර විශාල පිරිසක් බඳවා ගැනීම තුලින් පුහුණු කටයුතු සිදුකරගෙන යාමේදී පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ඊට සැලකිය යුතු කාලයක් අවශ්‍ය වීම යන කරුණු පැවතීම මත බඳවා ගැනීමට අනුමත ප්‍රමාණයන්ගෙන් ප්‍රතිශතයන් ලෙස එක් එක් අංශයන් වෙත බඳවා ගැනීම තුලින් මෙම තත්වය වළක්වා ගැනීමට කටයුතු කරනු ලබයි. | කාර්යමණ්ඩල අවශ්‍යතා කාලීනව හා නිවැරදිව හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම හෝ අවශ්‍ය නොවන්නේ නම් අනුමත සංඛ්‍යාව සංශෝධනය කරගත යුතු වීම. |
| (ඇ) | වැලිසර නාවික හමුදා රෝහලෙහි 2020 වර්ෂයේ සිට 2023 ජුනි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුලදී වාර්ෂිකව නේවාසික සහ බාහිර ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී තිබියදී රෝහල් කාර්යය මණ්ඩලය 365 සිට 286 දක්වා අඩු වී තිබීමෙන් රෝහල් කාර්යයභාරය ඉටු කිරීමේදී කාර්යය මණ්ඩලය දැඩි අපහසුතාවයකට පත්ව තිබුණි. | පවතින ආර්ථික අපහසුතාවයන් හමුවේ විශ්‍රාම ගන්වන ලද/ ආබාධිත නාවික පුද්ගලයින් හා ඔවුන්ගේ ඥාතීන් විශාල ප්‍රමාණයක් වැලිසර නාවික රෝහල වෙතින් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට පැමිණීම හා යුධමය වාතාවරණය හේතුවෙන් වෛද්‍ය අංශය වෙත එක් එක් බඳවා ගැනීම් යටතේ විශාල නාවිකයින් ප්‍රමාණයක් බඳවා ගෙන තිබුණු අතර, ඔවුන්ගේ අනුමත මූලික සේවා කාලය/ වසර 22 සේවා කාලය අවසානවීම යන කරුණ බලපා ඇත. මෙම තත්වය සමනයට පත් කර ගැනීම සඳහා ඉදිරියේදී වෛද්‍ය සහයක අංශය වෙත නව බඳවා ගැනීම් සිදුකරමින් පවතී. | රෝහල් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය සපයා ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ඈ) | නාවික හමුදාවේ සේවක සංඛ්‍යාව ඉදිරියේදී අඩු කිරීමේ යෝජනාව සලකා බැලීමේදී නාවික හමුදාවේ කාර්යය භාරය කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකර ගැනීම සඳහා සිටිය යුතු සංඛ්‍යාව පිළිබඳ කරනු ලබන උපාය මාර්ගික අධ්‍යයන කටයුතු අවසන් වී නොතිබුණි. | ශ්‍රී ලංකා නාවික හමුදාවේ අනුමත සේවක සංඛ්‍යාව 55,000 ක් වුවද, 2019 අගෝස්තු මස 23 දින සිට 53,000 ක උපරිමයකට යටත්ව පවත්වාගෙන යන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දී ඇත. කරුණු එසේ වුවද, නාවික හමුදාවේ 2030 සහ ඉන් ඔබ්බට වූ උපාය මාර්ගික සැලැස්මට අනුව මුළු සේවක සංඛ්‍යාව 40,000 දක්වා අඩු කිරීමට සහ නාවික | නාවික හමුදාව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ඉදිරියේදී අවශ්‍ය කාර්යමණ්ඩල ප්‍රමාණය නිවැරදිව හා කඩිනමින් හඳුනාගත යුතු වීම. |

හමුදා බලමුලුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව නාවික හමුදාධිපති විසින් මේ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට අධ්‍යන මණ්ඩලයක් පත් කර ඇති අතර, එහි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.